**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## AIA ඉන්ෂුවරන්ස් වෙතින් මුලතිව් ප්‍රදේශයේ දරුවන්ට අතහිත

ශ්‍රී ලංකාවේ පැවති 30 වසරක යුද්ධයෙන් උතුරු පළාතේ පාසැල් රැසකට හානිකර බලපෑම් එල්ල වූ අතර ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද විශාල වශයෙන් අඩාල විය. වසර 2009 දී යුද්ධය නිමාවට පත් වුවද උතුරේ පාසැල් යළි ගොඩ නැංවීම තවමත් සිදු වෙමින් පවතින්නේ, වී ඇති හානිය බරපතල නිසාවෙනි. මුලතිව්හි පිහිටි මුල්ලිවයික්කාල් බටහිර රජයේ දෙමළ මාධ්‍ය පාසැල එලෙස ප්‍රබල අයුරින් හානියට පත් පාසැලක් වේ.

සිසුන් 250ක් දෙනා සිප්සතර හදාළ මෙම පාසැල යළි ගොඩනැංවීමේ කාලීන අවශ්‍යතාවය මැනවින් පසක් කොට ගත් AIA ඉන්ෂුවරන්ස්, සමාගමෙහි ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් වශයෙන් පංති කාමර පහකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකරමින් පාසැලේ සෙසු යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීමේ මහඟු කර්තව්‍යයට දායකත්වය සැපයීය. මෙයට අමතරව සිසුන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පාසැල වෙත පරිගනක පුහුණු මධ්‍යස්ථානයක්ද AIA විසින් පරිත්‍යාග කරන ලදී.

මෙම නව ගොඩනැගිල්ල සිසු අයිතියට පත් කිරීමේ අවස්ථාවට AIA ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් සමගින් නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී උපුල් විජේසිංහ සහ මානව සම්පත් අධ්‍යක්ෂිකා චතුරි මුණසිංහ එක් වූහ.

"හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කරමින් යුද්ධය හේතුවෙන් අඩාල වූ උතුරු පළාතේ අධ්‍යාපන කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට දායක වීමට හැකිවීම අප ඉමහත් අභිමානයක් කොට සළකනවා. දරුවන් යනු

දේශයේ අනාගතයයි. ශ්‍රී ලංකාව සංවර්ධනයේ නව පරිච්ඡේදයක් වෙත ගමන් ගන්නා යුගයක වඩාත් ඵලදායක වූ සැබෑ වෙනසක් සිදුකිරීම සඳහා අපි ඇප කැප වී ක්‍රියා කරනවා. අධ්‍යාපනික විශිෂ්ටත්වය දිරිගැන්වීම සඳහා පිටුබලය සැපයීම අපගේ ආයතනික සමාජ වගකීම් ක්‍රියාවලිය තුළ ප්‍රමුඛස්ථානයක් ගන්නවා. එහිදී මේ දක්වා විශාල සිසු පිරිසකගේ අනාගතය ආලෝකමත් කිරීමට අප සමත්ව තිබෙනවා. මෙයද එම ජාතික වගකීම ඉටුකිරීමෙහිලා තබන ලද තවත් දෑවැන්ත පියවරක් වශයෙන් දැක්විය හැකියි.'' යනුවෙන් AIA ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් පවසා සිටියේය.

මෙය AIA ඉන්ෂුවරන්ස් මගින් උතුරේ ප්‍රතිසංස්කරණය කරන ලද දෙවන පාසැල වේ. මෙයට වසර දෙකකට පෙරාතුව සමාගම යාපනයේ වාසවිලාන් නවෝදයා පාසැල වෙත පංති කාමර රැසකින් සමන්විත ගොඩනැගිල්ලක් පරිත්‍යාග කරමින් ප්‍රදේශයේ අධ්‍යාපනික කටයුතු ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ත අයුරින් දායක විය.

**ඡායාරූප ඃ**

1) මුල්ලිවයික්කාල් බටහිර රජයේ දෙමළ මාධ්‍ය පාසැලෙහි අභිනවයෙන් ඉදිකරන ලද පාසැල් ගොඩනැගිල්ල

2) AIA ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන විධායක නිලධාරී ෂා රූෆ් සමගින් නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී උපුල් විජේසිංහ මෙම අවස්ථාවට සහභාගී වෙමින්

සමාප්තයි.

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman**

**Office – 2310028, Mobile – 0773 457 959**